# රොඩී කුලයේ නූතන වෙනස්වීම් පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

## (ශ්‍රී ලංකා සමාජය ආශ්‍රයෙන්)

ගීතානි අමරතුංග[1]

මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ රොඩී කුලයේ වර්තමානයේ සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳ සාකච්ඡා කිරීමයි. දකුණු ආසියාතික සමාජයට පමණක් ආවේණික වූ සුවිශේෂ සමාජ ස්ථරායන (Social Stratification) ක්‍රමයක් වන කුල ක්‍රමය (Caste System) අතීතයේ සිටම ශ්‍රී ලාංකීය සමාජය තුළ මුල් බැසගෙන තිබේ. ශ්‍රී ලංකාවේ විවිධ කුල රැසක් දක්නට ලැබුණ ද ඒ අතුරින් කුල ධූරාවලියේ (Caste hierarchy) පහළම ස්ථානය හොබවන්නේ රොඩී ජනතාවයි. ඔවුන් සංඛ්‍යාත්මක වශයෙන් ඉතා අල්ප වේ.

මෙම කුලීනයන් රොඩී වශයෙන් ඉතාම පහත් තත්ත්වයකින් සැලකීමට සිදුවූයේ රජවාසලට මුව මස් වෙනුවට මිනීමස් සැපයීමේ වරදටය (Knox: 1681; p70-71). වීදි පුරා ඇවිදිමින් සිඟමන් යදිමින් අනෙකුත් සියළුම ජන කොටස්වල පිළිකුලට අතීතයේ ඔවුන් පාත්‍ර විය. නමුත් වර්තමානය වන විට රොඩී කුලයේ සමාජ ආර්ථික පසුබිම ඔවුන්ගේ සංස්කෘතිය දැඩි ලෙස විපර්යාසයට බඳුන් වී තිබේ. ඒ අනුව මෙකී පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වන්නේ වර්තමානයේ රොඩී කුලයේ ඇති වී තිබෙන වෙනස්වීම් මොනවාද යන්න පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී සමානාත්මතාව සහ හිමිකම් වැනි සංකල්ප ප්‍රචලිත වීමත් සමඟම රොඩී ජනයාගේ සාම්ප්‍රදායික ජිවන රටාව පැහැදිලි වෙනසකට භාජනය විය. රොඩී ජනතාවගේ සංස්කෘතිය විවිධ වෙනස්වීම්වලට භාජනය වී තිබේ යන උපන්‍යාසය (hypothesis) මුල්කොට ගෙන රොඩී ජනතාවගේ අතීතයේ සිට වර්තමානය දක්වා ඇති වී තිබෙන වෙනස්වීම් පිළිබඳව අවධානය යොමු කිරීම මෙම පර්යේෂණයෙන් බලාපොරොත්තු වේ.

මුඛ්‍ය පද:- *කුල ක්‍රමය (Caste system), කුල ධූරාවලිය (caste hierarchy), සමාජ ස්ථරායනය (Social Stratification), සමාජය වෙනස්වීම (Social change)*

[1] සමාජ විද්‍යා අංශය, සමාජීය විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, geethaniamarathunga@gmail.com.